සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

**10 ශ්‍රේණිය** | **චිත්‍ර - I** | **කාලය පැය 01 යි**

නම/ විභාග අංකයඃ

- **ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**
- **පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.**



(01) මෙම රූපයේ දැක්වෙන නිර්මාණය ................................................................................ විහාරය නමින් හඳුන්වයි.

(02) මෙම විහාරය අඩි 01 යි අඟල් 08 ක් උස් වූ ගල් කණු ...................................................................... ක් මත ඉදිකර ඇත.

(03) විශිෂ්ට නිමාවන්ගෙන් යුතු චිත්‍ර නිර්මාණ රැසක් දක්නට ඇති මෙම විහාරය ................................................... යුගයට අයත් වේ.

(04) මෙම විහාරය තුළ ඇති සිතුවම් ...................................................................... ශිල්පක්‍රමයට නිර්මාණය කර ඇත.

(05) මෙම විහාරය තුළ ඇඳ ඇති ජාතක කතා අතර ................................................................... ජාතකය හා උරග ජාතකය ප්‍රධාන තැනක් ගනියි.

- **අංක 06 සිට 10 තෙක් ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.**

(06) ස්ක්‍රයිබ් නමින් හැඳින්වෙන, තම ස්වාමියා පවසන යමක් ලිවීමට සැරසී සිටින ආකාරය නිරූපිත මූර්තිය හමු වූ ස්ථානය නම් කරන්න.

.............................................................................................................................................

(07) පුනරුද යුගයේ චිත්‍ර ශිල්පීන් අඳින ලද, මරියතුමිය හා ජේසු බිළිඳා දැක්වෙන මැඩෝනා චිත්‍රවල ආභාසය ඇතිව නිර්මාණය කර ඇති, සිදුහත් කුමරු හා මව් බිසව සිතුවම නිර්මාණය කළ ශිල්පියා නම් කරන්න.

.............................................................................................................................................

(08) පුනරුද යුගයේ දී නිර්මාණය කර ඇති ''පර්වත මස්තකයේ දේවමෑණියෝ'' නම් සිතුවම දක්නට ඇති ස්ථානය නම් කරන්න.

.......................................................................................................................................

(09) ලාක්ෂා කලා කර්මාන්තය සඳහා වර්ණ සකසා ගැනීමට භාවිත කළ අමුද්‍රව්‍ය අතර රතු වර්ණය සඳහා භාවිතා කළ අමුද්‍රව්‍යය කුමක් ද?

.......................................................................................................................................

(10) ගීතයකට, කවියකට, නිසඳැසකට උචිත ආකාරයට නිර්මාණය කරන චිත්‍ර වර්ගය හඳුන්වන නම කුමක් ද?

.......................................................................................................................................

- **ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් දී ඇති ප්‍රශ්න සඳහා වඩාත්ම නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(11) ඉර සහ සඳ අයත් වන සාම්ප්‍රදායික සැරසිලි ඒකක ගනය කුමක් ද?

(i) නිර්ජීවී (ii) දිව්‍ය (iii) උද්භිද (iv) සත්ව

(12) ආශිර්වාද හෙවත් ආශිව මුද්‍රාව ලෙස ද හඳුන්වන, නිදහස දීම සංකේතවත් කරන මුද්‍රාව කුමක් ද?

(i) අභය මුද්‍රාව (ii) ධ්‍යාන මුද්‍රාව

(iii) විතර්ක මුද්‍රාව (iv) වරද මුද්‍රව

(13) මහනුවර යුගයේ දක්නට ලැබෙන හොඳම සඳකඩ පහණ හමු වන ස්ථානය කුමක් ද?

(i) ලංකාතිලක විහාරය (ii) රිදී විහාරය

(iii) බිසෝ මාලිගය (iv) දළදා මාලිගය

(14) ගම්පොළ යුගයේ ඉදි වූ ලංකාතිලක විහාරයේ නිර්මාණ ශිල්පියා වන්නේ,

(i) දේවේන්ද්‍ර මූලාචාරී නම් ශිල්පියා යි. (ii) දෙල්මඩ මූලාචාරී නම් ශිල්පියා යි.

(iii) ස්ථපතිරායර් නම් ශිල්පියා යි. (iv) ගනේෂ්වරාචාර්ය නම් ශිල්පියා යි.

(15) දෙගල්දොරුව රජමහා විහාරය තුළ සිතුවම් ඇඳි ප්‍රධාන ශිල්පියා වන්නේ,

(i) දෙල්මඩ මූලාචාරී ය. (ii) දේවේන්ද්‍ර මූලාචාරී ය.

(iii) දෙවරගම්පල සිල්වත්තැන ය. (iv) ජී. ඇස්. ප්‍රනාන්දු ය.

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍යය බැගින් ලියන්න.**

(16) මඩොල් කුරුපාව - ..........................................................................................

..........................................................................................

(17) ඔන්ඩිප්පායි - ..........................................................................................

..........................................................................................

(18) කුමුදුප්පල - ..........................................................................................

..........................................................................................

(19) අල්තාරය - ..........................................................................................

..........................................................................................

(20) පර්යංක ආසන - ..........................................................................................

..........................................................................................

- අංක 21 සිට 25 දක්වා දී ඇති රූප සටහන්වලට කිසියම් සබඳතාවක් දක්වන රූප සටහන, ඉදිරියෙන් ඇති **A, B, C, D, E** යන රූප සටහන් අතුරෙන් තෝරා, එයට අදාළ ඉංග්‍රීසි අක්ෂරය ප්‍රශ්න අංකය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.

| | | | | |
|---|---|---|---|---|
| (21) |  | (..................) |  | A |
| (22) |  | (..................) |  | B |
| (23) |  | (..................) |  | C |
| (24) |  | (..................) |  | D |
| (25) |  | (..................) |  | E |

- **ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා දී ඇති එක් එක් වාක්‍යය, හිස්තැනට සුදුසු වචනය / වචන යොදා සම්පූර්ණ කරන්න.**

(26) බුද්ධ චරිතයේ විවිධ අවස්ථා මෙන් ම, ඓතිහාසික සිද්ධි / පුවත් ඇඳ ඇති කැලණි විහාර බිතු සිතුවම් මගින්, නව බෞද්ධ විහාර චිත්‍ර ශෛලියක් හඳුන්වා දීමට පුරෝගාමී වූ ශිල්පියා .............................................................................. වේ.

(27) අලුත් සහල් අලුත් මැටි මුට්ටියක දමා පිළියෙල කර, කිරි ඉතිරිවී ම .............................................................................. යනුවෙන් හැඳින්වේ.

(28) ක්‍රි. පූ. 2440 ට පමණ අයත් .............................................................................. මූර්තිය, කුෆු පිරමීඩය ඉදිරිපිට පිහිටි උසින් අඩි 66 ක් හා පළලින් අඩි 240 ක් වන පැරණි මූර්තියක් ලෙස හඳුන්වා දිය හැකි ය.

(29) ලියනාඩෝ ඩාවින්චිගේ විශිෂ්ට නිර්මාණයක් වන මොනාලිසා සිතුවම .............................................................................. මත තෙල්සායම් මාධ්‍යයෙන් නිර්මාණය කර ඇත.

(30) ගඩලාදෙණිය විහාරය ඉදිරිපිට ගල්තලාව මත දැකිය හැකි, අඩි 12 ක් පමණ උස අධිතාලමක් මත හිඳි බුද්ධ ප්‍රතිමා සතරක් තැන්පත් කර ඇති, ගලින් නිම වූ ප්‍රතිමා ගෘහ 04 ක් සහිත ගොඩනැගිල්ල .............................................................................. නමින් හඳුන්වයි.

- අංක 31 සිට 35 දක්වා දී ඇති ප්‍රශ්නවලට **F, G, H, I, J** යන රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.



F



G



H



I



J

(31) F අක්ෂරයෙන් දැක්වෙන රූපයේ ඇති මූර්තියෙ හි ආසන ක්‍රමය නම් කරන්න.

.......................................................................................................................................

(32) G අක්ෂරයෙන් දැක්වෙන සිතුවම නිර්මාණය කර ඇති මාධ්‍යය කුමක් ද? ..........................................

(33) H අක්ෂරයෙන් දැක්වෙන සිතුවම හමු වූ ස්ථානය කුමක් ද?..............................................................

(34) I අක්ෂරයෙන් දැක්වෙන සිතුවම ඇඳ ඇති ස්ථානය කුමක් ද?..........................................................

(35) J අක්ෂරයෙන් දැක්වෙන වෙස් මුහුණු නිර්මාණය හඳුන්වන නම කුමක් ද?.........................................

- **පහත දැක්වෙන චිත්‍රය හඳුනාගෙන, එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි අංක 36 සිට 40 තෙක් සපයා ඇති උප මාතෘකාවලට අදාළව අර්ථවත් වාක්‍ය පහක් ලියන්න.**



(36) තේමාව :- ..........................................................................................

:- ..........................................................................................

(37) ශිල්පියා :- ..........................................................................................

:- ..........................................................................................

(38) ස්ථානය :- ..........................................................................................

:- ..........................................................................................

(39) වර්ණ භාවිතය :- ..........................................................................................

:- ..........................................................................................

(40) සම්පිණ්ඩනය :- ..........................................................................................

:- ..........................................................................................

(ලකුණු 40)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 2025
## Second Term Test - 2025

**10 ශ්‍රේණිය** | **චිත්‍ර - II** | **කාලය පැය 02 යි**

නම/ විභාග අංකයඃ

සැලකිය යුතුයි.

- ★ ඔබේ විභාග අංකය , පංතිය උත්තර පත්‍රයේ පසු පිටේ පැහැදිලි ව සටහන් කරන්න.
- ★ උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට වියළී තිබිය යුතු ය. තෙත සහිත චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකි ය.
- ★ දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් හෝ අතේ නොගෑවෙන ඕනෑ ම වර්ණ මාධ්‍යයක් භාවිත කළ හැකි ය.
- ★ සියලුම ද්‍රව්‍ය ඇස්මට්ටමින් පහළ සිටින සේ තැබීමට ශාලාධිපතිවරුන්ට උපදෙස් දී ඇත. එසේ නොතැබූ අවස්ථාවක් වුවහොත්, ඇඳීම පටන් ගැනීමට පෙර, විභාග ශාලාධිපතිට දැන්වීමට ඔබට අවසර තිබේ.

---

## නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

★ ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කොට, චිත්‍රය නිර්මාණය කරන්න.

1. රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න. මේ සඳහා රළු කඩදාසියක් භාවිත කරන්න.
2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ වර්ණ කරන්න.

★ **මෙම චිත්‍ර දෙක ම එකට අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.**

★ ඔබේ චිත්‍රය ඇගැයීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමුකරන බව සලකන්න.

- **රේඛා අධ්‍යයනය**
  1. මුල් කඩදාසියේ කරනු ලබන පූර්ව අධ්‍යයනයේදී දක්වන කුසලතා
- **වර්ණ චිත්‍රය**
  2. ද්‍රව්‍ය සමූහය තලය මත කලාත්මක ව සම්පිණ්ඩනය වීම.
  3. පරිමාණ, පර්යාලෝක රීති හා ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය.
  4. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හා ගති ලක්ෂණ දැක්වීම.
  5. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතාව
  6. උචිත පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

10 ශ්‍රේණිය

චිත්‍ර - ශාලාධිපති උපදෙස්

**නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය**

**ශාලාධිපතිට උපදෙස්**

- පහත දක්වා ඇති ආකාරයට ද්‍රව්‍ය සම්පිණ්ඩනය සකස් කරන්න.
- ඇස් මට්ටමෙන් පහළ සිටින සේ ද්‍රව්‍ය සමූහය තබන්න.

**යෝජිත ද්‍රව්‍ය**

01. සුදු කඩදාසියකින් ආවරණය කරන ලද හිස් පෙට්ටියක්
02. සිලින්ඩරාකාර වීදුරු බෝතලයක්.
03. කොළ 5 ක් සහිත වර්ණවත් ක්‍රෝටන් අත්තක්
04. ඉරි සහිත රෙදි කැබැල්ලක්
05. ගස්ලබු ගෙඩියක්
06. භාණ්ඩ තැබීමට සුදුසු ආධාරකයක්



සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 2025
Second Term Test - 2025

10 ශ්‍රේණිය | චිත්‍ර - III | කාලය පැය 02 යි

නම/ විභාග අංකය:

සැලකිය යුතුයි

- ඔබ ඇඳිය යුත්තේ එක් චිත්‍රයක් පමණි.
- ඔබේ විභාග අංකය, පංතිය හා අදාළ ප්‍රශ්න අංකය උත්තර පත්‍රයේ පසු පිටෙහි පැහැදිලිව ලියන්න.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාරදෙන විට වියළී තිබිය යුතුය.
- දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් වර්ණ කිරීමට භාවිත කළ හැකිය. (මකන දියර භාවිතය සුදුසු නැත.)
- 'අ' කොටසින් හෝ 'ආ' කොටසින් හෝ 'ඉ' කොටසින් හෝ එක් මාතෘකාවක් පමණක් තෝරා වර්ණවත් චිත්‍රයක් නිර්මාණය කරන්න.

---

"අ" කොටස - ප්‍රකාශන චිත්‍ර

(01) නිදහස් වනයේ සැරිසරන මුව රංචුවක්

(02) මසුන් මිල දී ගැනීමට ධීවර වරායට පැමිණි පිරිසක්

(03) නාගරික පාන් රථයක් අසල සිද්ධියක්

(04) මංගල උත්සවයක්

"ආ" කොටස - මෝස්තර නිර්මාණය

(05) පැති අටකින් යුත් කුඩයකට මල සහ කොළය ඇසුරෙන් මෝස්තරයක් නිර්මාණය කරන්න.

(06) අලුත් අවුරුදු උළෙලක් සැරසිලි කිරීම සඳහා සුදුසු ලෙස පතාකයක් නිර්මාණය කරන්න.

(07) සත්ව රූපයක් භාවිතයෙන් සමචතුරස්‍රාකාර මේස රෙද්දකට සුදුසු මුළුතල මෝස්තරයක් නිර්මාණය කරන්න.

"ඉ" කොටස - ග්‍රැෆික් චිත්‍ර

(08) අලුතින් වෙළඳපළට හඳුන්වා දෙන දත් බෙහෙත් නිෂ්පාදනයක් සඳහා උචිත දවටනයක් නිර්මාණය කරන්න.

(09) වන සම්පත් සුරකිමු තේමාවට පෝස්ටරයක් නිර්මාණය කරන්න.

(10) ළමා කතන්දර පොතක් සඳහා සුදුසු පොත් පිටකවරයක් නිර්මාණය කරන්න.

## පිළිතුරු පත්‍රය - I පත්‍රය (ලිඛිත)

(01) මැදවල ටැම්පිට
(02) 34 ක
(03) මහනුවර
(04) ප්‍රෙස්කො සිකෝ
(05) වෙස්සන්තර
(06) සක්කාරා ප්‍රදේශයේ සොහොන් ගෙයකින්
(07) ලූවර් ජාතික කලාගාරයේ
(08) එම්. සාර්ලිස්
(09) සාදලිංගම් කුඩු
(10) සන්නිදර්ශන චිත්‍ර
(11) ii දිව්‍ය
(11) i අභය
(13) iv දළදා මාලිගය
(14) ii ස්ථපතිරායර් නම් ශිල්පියායි
(15) ii දෙවරගම්පල සිල්වත් තැන
(16) ඇම්බැක්ක දේවාලයේ සුවිශේෂ වූ පියස්ස, පරාල 26 ක් එක් ලී ඇණයකට සම්බන්ධ කර නිර්මාණය කර ඇති ගෘහ නිර්මාණාත්මක අංගය මඩොල් කුරුපාව නමින් හඳුන්වයි.
(17) මඩකලපු පන් පැදුරු රටා අතර ජ්‍යාමිතික හැඩතල වලින් යුක්ත රටා
(18) පාලි භාෂාවෙන් කඩුපුල් මල හැඳින් වූ නම
(19) කතෝලික දේවස්ථානවල පූජාව පවත්වන ස්ථානය වේ.
(20) හින්දු ප්‍රතිමාවල හිඳ සිටින ඉරියව්වක ආකාරය පර්යංක ආසන වේ.
(21) D
(22) E
(23) C
(24) B
(25) A
(26) සෝලියස් මෙන්ඩිස්
(27) පොංගල්
(28) ස්පින්ක්ස්
(29) පොප්ලර් නැමති ලීයක්
(30) විජයොත්පාය
(31) රාජ ලීලාසන
(32) කැන්වසය මත තෙල් සායම්
(33) තීබ්ස්වල නෙබාමුන් සොහොන් ගැබෙන්
(34) සිස්ටයින් දෙව් මැදුරේ
(35) හේවා කෝලම
(36) හේමමාලා කුමරිය හා දන්ත කුමරු ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කරවීම මෙම සිතුවමින් දැක්වේ.
(37) මෙය සෝලියස් මෙන්ඩිස් ශිල්පියාගේ සිතුවමකි.
(38) මෙම සිතුවම නව කැලණි විහාරයේ ඇඳ ඇත.
(39) ''ඓතිහාසික බිතු සිතුවම්වල දක්නට ලැබෙන සංගත වර්ණමාලාවක් භාවිතා කරමින් ත්‍රිමාණ ලක්ෂණ සියුම් ලෙස මතුකර ඇත.'' සිතුවම් සඳහා වර්ණ යෙදීමේ දී අඳුරු කහ, දුඹුරු, කළු, සුදු ආදී වර්ණවල ප්‍රභේද මතුවන අයුරින් චිත්‍ර නිර්මාණය කර ඇත.
(40) විශාල අවකාශයක් මත මානව රූප ලාලිත්‍යමය ඉරියව්වලින් යුතුව සම්පිණ්ඩනය කර ඇත.

පිළිතුරු පත්‍රය I පත්‍රය - 1 x 40 = 40

## II පත්‍රය - ස්වාභාවිකත්ව අධ්‍යයනය හා ද්‍රව්‍ය සම්පිණ්ඩනය ලකුණු දීමේ නිර්නායක

| | | |
|---|---|---|
| (1) | රේඛා අධ්‍යයනය | - ලකුණු 05 |
| (2) | ද්‍රව්‍ය සමූහය තලය මත අර්ථවත් සංචරනය කිරීමේ හැකියාව | - ලකුණු 05 |
| (3) | ද්‍රව්‍යයන්ගේ පරිමාණ හා ස්වභාවය ප්‍රකාශ කිරීමේ හැකියාව | - ලකුණු 05 |
| (4) | සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය (පර්යාවලෝකය ත්‍රිමාණ ලක්ෂණ ඇස් මට්ටමක අවකාශ භාවිතය) | - ලකුණු 05 |
| (5) | වර්ණ භාවිතය හා ගති ලක්ෂණ දැක්වීම | - ලකුණු 05 |
| (6) | චිත්‍රයේ පසුතලය ඇතුළු සමස්ත නිමාව | - ලකුණු 05 |
| II වන ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු | | - ලකුණු 30 |

**III පත්‍රය - "අ"කොටස - චිත්‍ර සංරචනය**

**ලකුණු දීමේ නිර්ණායක**

(1) තෝරාගත් මාතෘකාව ප්‍රකාශ කිරීමේ දී ඊට උචිත වාතාවරණය හා ප්‍රකාශනය කර ඇති අයුරු - ලකුණු 06

(2) මානව රූප හා සත්ත්ව රූ ඇතුළු සියලු හැඩතල තලය මත සම්පිණ්ඩනය කර ඇති අයුරු - ලකුණු 06

(3) සිද්ධාන්ත භාවිතය (ත්‍රිමාණ ලක්ෂණ, පර්යාවලෝකය, පරිමාණය) - ලකුණු 06

(4) වර්ණ භාවිතයේ කුසලතා - ලකුණු 06

(5) අනුමත ශෛලියට අනුව චිත්‍රයේ සමස්ත නිමාව - ලකුණු 06

**මුළු ලකුණු** - **ලකුණු 30**

**III පත්‍රය "ආ"කොටස - මෝස්තර හා සැරසිලි නිර්මාණය**

**ලකුණු දීමේ නිර්ණායක**

(1) මාතෘකාවට හා කාර්යයට උචිත අයුරින් නව්‍යතාවයකින් යුතුව සැලසුම් කිරීම. - ලකුණු 06

(2) පාරිභාරික අවශ්‍යතාවන්ට ගැළපෙන බව. - ලකුණු 06

(3) නිර්මාණාත්මක බව හා හැඩතල සමපිණ්ඩනය කිරීමේ හැකියාව - ලකුණු 06

(4) උචිත වරණ තෝරාගෙන භාවිත කිරීමේ හැකියාව - ලකුණු 06

(5) විචිත්‍රත්වය, චමත්කාර ජනක බව, සමස්ත නිමාව - ලකුණු 06

**මුළු ලකුණු** - **ලකුණු 30**

**III පත්‍රය "ඉ"කොටස - ග්‍රැෆික් චිත්‍ර**

**ලකුණු දීමේ නිර්ණායක**

(1) මාතෘකාවට අදාළ නිර්මාණ කාර්යයට උචිත අයුරින් සැලසුම් කිරීම. - ලකුණු 06

(2) වාණිජමය හා කර්මාන්තයට උචිත අයුරින් සැලසුම් කිරීම. - ලකුණු 06

(3) රේඛා හා හැඩතල හා සැරසිලි අර්ථවත්ව භාවිත කිරීමේ හැකියාව - ලකුණු 06

(4) උචිත වර්ණ තෝරාගෙන භාවිත කිරීම. - ලකුණු 06

(5) විචිත්‍රත්වය, චමත්කාරය හා සමස්ත නිමාව. - ලකුණු 06

**මුළු ලකුණු** - **ලකුණු 30**

| | | | | |
|---|---|---|---|---|
| **(i)** | - | පත්‍රය සඳහා - ලකුණු | = | 40 |
| **(ii)** | - | පත්‍රය සඳහා - ලකුණු | = | 30 |
| **(iii)** | - | පත්‍රය සඳහා - ලකුණු | = | 30 |
| | | මුළු ලකුණු | = | 100 |